# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,474 - 2026 ජනවාරි මස 30 සිකුරාදා - 2026.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 390 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 434 |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 පෙබරවාරි මස 20 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 පෙබරවාරි මස 06 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2026 ජනවාරි මස 01 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

387 - B 82759 - (2026/01)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලීසිය

<u>උපසේවා සහකාර පොලිස් අධිකාරි / කාන්තා සහකාර පොලිස් අධිකාරි (විදුලි සංදේශ ඉංජිනේරු සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු) තනතුරු</u>

ශ්‍රී ලංකා පොලිසියේ උපසේවා සහකාර පොලිස් අධිකාරි /කාන්තා සහකාර පොලිස් අධිකාරි (විදුලි සංදේශ ඉංජිනේරු සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු) තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් **අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගැනීමේ කොට්ඨාසය, අංක 375, පළමු මහළ, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2026..02.27 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. අයදුම්පත් යොමු කිරීම අවසාන දින දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් වෙතොත් අයදුම්කරු විසින් එය විඳදරාගත යුතු ය.

04. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

05. **වැටුප් ක්‍රමය**

රු. 82150 -10x2400-8x2940-17x3900-රු.195970.00

මෙම වැටුප් ගණනය කිරීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2025 ප්‍රකාරව වැටුප් කේත SL- 1-2025 යටතේ සිදුකර ඇත.

තව ද මෙම නිලධාරින්ට 2022.12.15 දිනැති ශ්‍රී ලංකා පොලීසියේ නිවේදන CRTM 260, RTM 385, පරිදි ලබා දෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු.17800.00 |
| (ආ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු.250.00 |
| (ඇ) | දුෂ්කර දීමනාව | රු.2000.00 |
| (ඇ) | රා.ප.ච.අංක 18/2015(1)අනුව විශේෂ දීමනාව | රු. 3000.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | රු.34800.00 |
| (ඊ) | විශේෂ දීමනාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2025 අනුව වැටුපෙන් 22%ක් සමඟ රු.1250.00 |

<u>මෙම දීමනා වලට අමතරව</u>

I. ප්‍රවාහන පහසුකම්.
II. නිලධරයන්ට සුභසාධන වෛද්‍ය පහසුකම්.
III. නිල ඇඳුම්.

**අවශ්‍ය මූලික සුදුසුකම්**

**6.1** **වයස් සීමාව**

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 25-45 අතර විය යුතු ය.

**6.2 අධ්‍යාපන සුදුසුකම්**

**විදුලි සංදේශ ඉංජිනේරු තනතුර**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති විශ්ව විද්‍යාලයකින් වසර 04 ක පූර්ණ කාලීන විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම ;

II. ඉහත I හි සඳහන් උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතික ලබා තිබීම.

**ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු තනතුර**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති විශ්ව විද්‍යාලයක වසර 04 පූර්ණ කාලීන ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

II. ඉහත I හි සඳහන් උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතික ලබා තිබීම.

**6.3 වෘත්තීය සුදුසුකම්**

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය (Associated Membership) ලබා තිබීම හෝ පූර්ණ සාමාජිකත්වය (Corporate Membership) ලබා තිබීම.

**6.4 වෘත්තීය පළපුරුද්ද**

උපාධිය ලබාගැනීමෙන් පසුව අවම වශයෙන් තුන් අවුරුදු කාලයක් අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක සේවා පළපුරුද්ද.

**6.5 කායික සුදුසුකම්**

**I.** සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**II.** **පිරිමි :-** උස අඩි 05 අඟල් 06 ට නොඅඩු විය යුතු ය. පපුව අඟල් 32 ට නොඅඩු විය යුතු ය. (හුස්ම නොඅල්ලා)

**III.** **කාන්තා:-** උස අඩි 05 අඟළ 04 නොඅඩු විය යුතු ය.

**6.6 දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්**

උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච සහිතව හෝ රහිතව ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර ද, වර්ණ පෙනීම සාමාන්‍ය ද විය යුතු ය.

**6.7 වෙනත් සුදුසුකම්**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. අයදුම්කරුවන් හා අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලීසිය අපේක්ෂිත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. විවාහක / අවිවාහක දෙපාර්ශවයටම අයදුම් කල හැක.
IV. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.
V. කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. (උදා- පච්ච කොටා නොතිබිය යුතු ය )

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 6.1 සිට 6.7 දක්වා ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* නිවේදනයේ සඳහන් දිනට එහි සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අදාළ නොවේ |
| 02. සේවා පළපුරුද්ද | 30 | |
| 03. අතිරේක භාෂා දැනුම හා පරිගණක හැකියාව | 20 | |
| 04. නායකත්වය / ප්‍රජා සේවාවන් | 10 | |
| 5. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| **එකතුව** | **100** | |

7.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත්කරන බලධාරියා:- පත්කිරීමේ බලධාරියා හෝ ඔහු විසින් බලය පවරන ලද බලධාරියා.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ප්‍රධාන විෂයයන් හා උපරිම ලකුණු ප්‍රමාණයන් ඉහත පරිදි වේ.

7.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව මත ප්‍රමුඛතා ලේඛනය අනුව බඳවා ගැනීම තීරණය කරනු ලැබේ.

7.3. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.

**08. පසුබිම් පරීක්ෂණය**

8.1. බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ / අයදුම්කාරියන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා පසුබිම් පරීක්ෂණය පවත්වනු ලබයි.

8.2. අයදුම්කරුගේ / අයදුම්කාරියගේ යහපත් චරිතය තහවුරු කරගැනීම සඳහා ඔහු / ඇය හා ඔහුගේ / ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු / ඇය සමීපව ඇසුරු කරන්නන්ගේද යහපත් චරිතය, හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් පරීක්ෂණ වාර්තා සහිත අයදුම්කරුවන් / අයදුම්කාරියන් බඳවාගනු නොලැබේ.

*සටහන* :- සමීප ඥාතීන් සම්බන්ධයෙන් අපරාධ වාර්තා කිසිවක් නොතිබිය යුතුය. සමීප ඥාතීන් යනු අයදුම්කරු / අයදුම්කාරියගේ මව, පියා, භාරකරුවන්, සහෝදර සහෝදරියන් සහ සහෝදර සහෝදරියන් විවාහක නම් කලත්‍රයන් ද, අයදුම්කරු / අයදුම්කාරිය විවාහක නම් කලත්‍රයන්, කලත්‍රයන්ගේ සහෝදර සහෝදරියන් සමීප ඥාතීන් ලෙස සලකනු ලැබේ.

8.3 බඳවා ගැනීමේදී අයදුම්කරුවන් / අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු / ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඕනෑම අවස්ථාවකදී පත්වීම අවසන් කරනු ලැබේ.

**09. වෛද්‍ය පරීක්ෂණ**

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි ඇතුළු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. තවද මෙහි දී අයදුම්කරුවන් / අයදුම්කාරියන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතා පරීක්ෂණයකට ද භාජනය කරනු ලැබේ. ප්‍රධාන වෛද්‍ය නිලධාරී විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කළ යුතු ය. වෛද්‍ය පරීක්ෂණය අසමත් වන අයදුම්කරුවන්ට සහ අයදුම්කාරයන්ට අභියාචනා ඉදිරිපත් කළ නොහැක.

**10. පුහුණුව**

පසුබිම් පරීක්ෂණයෙන් සහ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් /අයදුම්කාරියන් අතරින් ප්‍රමුඛතා ලේඛනයට අනුව උපරිම ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අනුමත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පොලිස්පති විසින් නියම කරන ලද දිනයක දී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මෙම පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ දී ලබා දෙනු ලැබේ.

**11. සේවා කොන්දේසි**

I. ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, ජාතික පොලිස් කොමිෂන් සභා, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ , පොලිස් නියෝග, ශ්‍රී ලංකා පොලිසියේ අත්පොත්වල සහ උපදෙස් සංග්‍රහ වල විධිවිධාන වලට ද යටත් විය යුතු ය.

II. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29, 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අදාළවේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය) :

(අ) උප්පැන්න සහතිකය,
(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන ),
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික,
(ඊ) නායකත්වය සනාථ කිරීම සම්බන්ධ සහතික,
(උ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(ඌ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13.1. දැනටමත් රාජ්‍ය සේවයෙහි සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් / අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් /අයදුම්කාරියන් උක්ත තනතුර සඳහා සුදුසුකම් ලදහොත් දැනට අනුයුක්තව ඇති රැකියාවෙන් මුදාහැරීමට හැකි බවට ආයතන ප්‍රධානියා ගෙන් ලබාගත් සහතිකයක් අමුණා එවිය යුතු ය.

13.2. අයදුම්කරු / අයදුම්කාරියන් විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමඟ ඉහත 02 ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව භාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට / අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන* - පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට / අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

2026 ජනවාරි මස 10 දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 02.

## ශ්‍රී ලංකා පොලීසිය

පොලිස් උප සේවා සහකාර පොලිස් අධිකාරි / කාන්තා සහකාර පොලිස් අධිකාරි
(විදුලි සංදේශ ඉංජිනේරු සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු) තනතුර

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (*අ*) සම්පූර්ණ නම : ..........................................................................................................................
(පැහැදිළි ලොකු අකුරෙන් ) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය.

(*ආ*) නම : (මුලකුරු සමඟ) ..........................................................................................................................

(*ඇ*) ස්ත්‍රී / පුරුෂ භාවය : ..........................................................................................

(*ඈ*) අයදුම් කරන තනතුර : ..........................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය)

03. (*අ*) වර්තමාන ලිපිනය : ..........................................................................................................................
..........................................................................................................................................................

(*අ*) ස්ථිර ලිපිනය : ..........................................................................................................................
..........................................................................................................................................................

(*ඇ*) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය : ..........................................................................................

(උ) දුරකථන අංක -
ජංගම ..................................................................
නිවස ..................................................................

04. (අ) ජාතිය ..................................................
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න )

05. උපන් දිනය : .....................................................

(උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් අමුණා එවිය යුතු යි.)

වයස - (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු ......................... මාස ................................. දින ............................

06. සිවිල් තත්ත්වය :- විවාහක/අවිවාහක/වැන්දඹු/වැන්දඹු පුරුෂ ..........................
කලත්‍රයාගේ රැකියාව :- .................................................................
කලත්‍රයාගේ රැකියා ස්ථානය :- .................................................................

07. උස :- අඩි.....................අඟල්...................... පපුව (පිරිමි) - අඟල්................

08. අධ්‍යාපන සුදුසුකම් -..................................................................................
(සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු ය.)

09. වෘත්තිය සුදුසුකම් -.........................................................................................
(සහතිකපත්වල ඡායා පිටපත් අමුණා එවිය යුතු ය.)

10. පශ්චාත් උපාධි -..............................................................................................
(සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතු ය.)

11. වර්තමාන සේවා තත්ත්වය

(අ) දැනට දරන තනතුර.......................................................................................
(ආ) දැනට දරන තනතුරේ ශ්‍රේණිය....................................................................
(ඇ) වර්තමාන සේවා ස්ථානය............................................................................

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක් වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත්වන බව දනිමි.

...............................
දිනය.................................... අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන

12. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................................................. මයා / මිය .................................................... ............................................ දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ / මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු /ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

තනතුර..........................................................
දිනය.............................................................

01-321

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

දේශීය වෛද්‍ය අංශය

**රජයේ හෝමියෝපති රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම - 2025 වර්ෂය**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි, දේශීය වෛද්‍ය අංශය යටතේ ඇති රජයේ හෝමියෝපති රෝහලේ විධායක නිලධාරි සේවා ගණයේ II ශ්‍රේණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ **2025.06.30** දිනට පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් එවිය යුතු අවසාන දිනට හෝ ඊට පෙර ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමි මාවත, කොළඹ 10 යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස ඉහල කෙළවරේ "රජයේ හෝමියෝපති රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම 2025" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

**(අ) අයදුම්පත් එවිය යුතු අවසාන දිනය: 2026.02.20 දින වේ.**

***සටහන:*** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් භාරගත යුතු ය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :*

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට, මෙම නිවේදනයේ 5 ඡේදයෙහි සඳහන් සියලුම සුදුසුකම් සපුරා ඇති හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි රජයේ හෝමියෝපති වෛද්‍ය නිලධාරියෙකු වශයෙන් සේවයේ නියුතු බවට නෛතිකව තහවුරුවන වෛද්‍ය නිලධාරීන් අතරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ.

II. මෙම තනතුර පරිපාලන II ශ්‍රේණියේ තනතුරක් වන අතර, බඳවා ගැනීමෙන් පසු උසස් කිරීම් සිදුකරනුයේ රජයේ හෝමියෝපති රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේ පරිපාටියෙහි දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ය.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018.09.17 දිනැතිව අනුමත කරන ලද රජයේ හෝමියෝපති රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේ පටිපාටියෙහි ඇතුළත් නියමයන් සහ කොන්දේසිවලට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව මාසිකව,

රු. 82,150-10 x 2,400-8 x 2,940-17 x 3,900-රු.195,970 (SL 1- 2025-12 පියවර)

04. *වයස් සීමාව :* අදාළ නොවේ.

05. *සුදුසුකම් :*

5.1 *අධ්‍යාපන සුදුසුකම් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය උසස් අධ්‍යාපන ආයතනයක්, පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසරකට නොඅඩු රෝහල් කළමනාකරණයට අදාළ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පිළිගනු ලබන ඕනෑම පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

5.2 *වෘත්තීය සුදුසුකම් :*

හෝමියෝපති වෛද්‍යවරයෙකු වශයෙන් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම සහ රජයේ හෝමියෝපති වෛද්‍ය නිලධරයෙකු වශයෙන් සේවයේ යෙදී සිටීම.

5.3 *පළපුරුද්ද :*

හෝමියෝපති වෛද්‍ය නිලධාරියකු ලෙස II ශ්‍රේණියේ වසර 08 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අටක් (08) උපයාගෙන තිබීම.

5.4 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5.5 *වෙනත් සුදුසුකම් :*

i. තනතුරේ ස්ථිර කර තිබිය යුතු ය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව දඬුවමක් ලබා නොතිබීම.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබීම.

6. *සම්මුඛ පරීක්ෂණය :*

6.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

6.2 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය පහත පරිදි වේ.

01. *අතිරේක අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු 25*

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි විධිවිධාන අනුව

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලබන උපාධියක් ;

*හෝ*

2. ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් උපාධියක්

***සටහන :*** තනතුරේ ස්ථිර කිරීමට හෝ උසස්වීම් ප්‍රදානය කිරීමට පෙර ඒ ඒ උපාධියේ සත්‍යතාවය පිළිබඳව අදාළ විශ්වවිද්‍යාලයෙන් සත්‍යාපනය කර ගත යුතුවේ.

* වෛද්‍ය විද්‍යාවට හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධිත

| | | |
|---|---|---|
| (*අ*) | දර්ශනපති උපාධිය (Ph.D) | - ලකුණු 25 |
| (*ආ*) | දර්ශනවේදී උපාධිය (M.Phill) | - ලකුණු 20 |
| (*ඇ*) | විද්‍යාපති උපාධිය (MSc) | - ලකුණු 18 |
| (*ඈ*) | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - ලකුණු 15 |
| (*ඉ*) | විද්‍යාවේදී උපාධිය (BSc) | - ලකුණු 10 |
| (*ඊ*) | ඩිප්ලෝමා පාඨමාලාව (මාස 06 හෝ ඊට වැඩි) | - ලකුණු 05 |
| (*උ*) | සහතිකපත්‍ර පාඨමාලා | - ලකුණු 03 |

***සටහන 2:*** ඉහත අංක 5.1 සුදුසුකම් යටතේ අදාළ කරගනු ලැබූ අධ්‍යාපන සුදුසුකම් සඳහා මෙහි දී ලකුණු ලබා දෙනු නොලැබේ. වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ හෝමියෝපති නොවන වෙනත් වෛද්‍ය ක්‍රම පිළිබඳ පාඨමාලාවන බටහිර ඖෂධවේදය (Pharmacy) සායනික මනෝවිද්‍යාව (Clinical Psychology), භෞතික චිකිත්සකවේදය (Physiotherapy) වැනි ක්ෂේත්‍ර අදාළ වේ.

02. *අතිරේක පළපුරුද්ද - උපරිම ලකුණු 40*

ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දීමේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 අනුව මූලික සුදුසුකමට අවශ්‍ය අවම සේවා කාලයට අමතරව සපුරා ඇති සේවා කාලයක් සඳහා, වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණය සෙසු නිලධාරින්ට ඊට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

03. *පර්යේෂණ හා ප්‍රකාශන සඳහා (උපරිම ලකුණු 15)*

හෝමියෝපති වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළව පළකර ඇති ජාත්‍යන්තර/ජාතික මට්ටමේ සඟරා/පොත්/ප්‍රකාශන පර්යේෂණ යනාදිය සඳහා

(*අ*) ජාත්‍යන්තර මට්ටමේ සඟරාවල ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සඳහා (එකකට ලකුණු 2.5 බැගින් උපරිම ලකුණු 5)

(ආ) ජාතික මට්ටමේ සඟරා / ප්‍රකාශන / පුවත්පත්හි පළකළ ලිපි සඳහා (එකකට ලකුණු 02 බැගින් උපරිම ලකුණු 10)

*සටහන -* කතෘන් කිහිප දෙනෙකුගේ සහභාගිත්වයෙන් පළ කරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දායකත්ව ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දායකත්ව ප්‍රමාණයට සමානුපාතිකව අයදුම්කරුවන්ට ලකුණු ලබා දෙනු ලැබේ.

04. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය කෙරෙහි දක්වා ඇති දායකත්වය (උපරිම ලකුණු 15)

(අ) හෝමියෝපති ක්ෂේත්‍රයට අදාළ කමිටු හෝ වෛද්‍ය සභාවේ සභාපති/ සාමාජික තනතුරු දැරීම (එකකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 09)

(ආ) ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර සාකච්ඡා / සම්මන්ත්‍රණ වල දී පර්යේෂණ පත්‍රිකා / කුසලතා ඉදිරිපත් කිරීම (එකකට ලකුණු 02 බැගින් උපරිම ලකුණු 06)

*සටහන -* ඉහත සාමාජිකත්වය දැරීම හා සහභාගීවීම් සනාථ කිරීමට අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු ය.

05. නායකත්වය / ආකල්ප / කුසලතාවය / පෞරුෂත්වය/ සන්නිවේදන කුසලතා යන නිර්ණායක යටතේ සලකා බලා උපරිම ලකුණු 05 ක් සම්මුඛ පරීක්ෂණයේ දී ලබා දෙනු ලැබේ.

07. ***අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :***

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ සුදුසුකම් සනාථ කරමින් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් සනාථ කරන සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම හෝ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉල්ලා සිටින විටෙක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානම්ව සිටිය යුතු ය. සුදුසුකම් සනාථ කරන සත්‍ය පිටපත් කළ ලේඛන අයදුම්පතට අමුණා එවීම අනිවාර්ය වේ.

i. උප්පැන්න සහතිකය;
ii. ජාතික හැඳුනුම්පත;
iii. සේවා සහතිකය;
iv. උපාධි හා පශ්චාත් උපාධි සහතිකය;
v. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය;
vi. ඉහත අංක 6 යටතේ සඳහන් සුදුසුකම් සනාථ කරන ලේඛණයන් හි මුල් පිටපත්.

08. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්පත්‍රය සෙ.මී. 22x29 ප්‍රමාණයේ A4 වර්ගයේ කඩදාසියක සකස් කළ යුතු අතර අංක 01 සිට අංක 08 දක්වා ශීර්ෂ පළමුවන පිටුවට ද අංක 09 සිට අංක 10 දක්වා ශීර්ෂ දෙවන පිටුවට ද වන සේ ගෙන සකස් කර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

09. ***සාවද්‍ය තොරතුරු සැපයීම.***

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10. පුරප්පාඩු සියල්ල සම්පූර්ණ කිරීම සම්බන්ධ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව සතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි,

ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ජනවාරි මස 02 දින.

රජයේ හෝමියෝපති රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම - 2025

1. පෞද්ගලික තොරතුරු

i. (අ) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..................................................................................................................

(ආ) මුලකුරු සමඟ නම (සිංහලෙන්/ දෙමළෙන්) :
..................................................................................................................

ii. (අ) මුලකුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..................................................................................................................

(ආ) මුලකුරුවලින් කියවෙන නම් (සිංහලෙන්/ දෙමළෙන්) :
..................................................................................................................

iii. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ලිපි එවනු ලබන්නේ මෙම ලිපිනයටය) :

..................................................................................................................
..................................................................................................................

iv. ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :
..................................................................................................................
..................................................................................................................

v. දුරකථන අංක : ජංගම : .................. ස්ථාවර : ............................

vi. (අ) උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ) 2024.06.30 දිනට වයස : අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

vii. ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී: ☐ පුරුෂ: ☐

viii. විවාහක ද / අවිවාහක ද : විවාහක: ☐ අවිවාහක: ☐

ix. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග : ......................................................................................

x. ස්ථිර පදිංචි ස්ථානය අයත්

(අ) පළාත් සභාව: ..............................................................................

(ආ) දිස්ත්‍රික්කය: ..............................................................................

(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ....................................................

xi. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

02. සේවා කාලය පිළිබඳ තොරතුරු

I. මුල් පත්වීම් දිනය :
.......................................................................................................................

II. කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර ඇති ද යන වග :
.......................................................................................................................

| *අනු අංකය* | *විෂයය* | *සමත් වූ දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

III. සේවා වාර්තාව :

| *සේවා ස්ථානය* | *කාල සීමාව* |
|---|---|
| | |
| | |

IV. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කළ දිනය :

<table>
<tr><td rowspan="2">රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව</td><td>පරීක්ෂණය</td><td>දිනය</td></tr>
<tr><td></td><td></td></tr>
<tr><td rowspan="2">රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව</td><td>පැය ගණන</td><td>දිනය</td></tr>
<tr><td></td><td></td></tr>
</table>

V. පත්වීම ස්ථිර කළ දිනය : ……………………………………….

VI. II ශ්‍රේණියට උසස් කළ දිනය : ……………………………………….

VII. හෝමියෝපති වෛද්‍ය නිලධාරියෙකු ලෙස II ශ්‍රේණියේ වසර 08 සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය : ……………………………………….

VIII. වර්තමාන ශ්‍රේණිය : ……………………………………….

IX. මුල් පත්වීම් දින සිට වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබේ ද, ඒ පිළිබඳ තොරතුරු :
.........................................................................................

X. ඔබට එරෙහිව විනය ක්‍රියාමාර්ග කිසිවක් ගෙන තිබේ ද?
විනය දඬුවම්වලට භාජනය වී ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු
.................................................................................................................................................................

03. ලබා ඇති පශ්චාත් උපාධි සුදුසුකම් :

| *ආයතනය* | *පාඨමාලාවේ නම* | *කාලය* | *සම්පූර්ණ කළ දිනය* |
|---|---|---|---|
| | | | |

04. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචිය පිළිබඳ විස්තර

I. ලියාපදිංචි අංකය: ........................................................................................

II. වර්ෂය: ..................................................................................................

මෙම ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අදාළ ලේඛනවල සහතික කරන ලද පිටපත් මේ සමඟ අමුණා ඇති බවත් මම මෙයින් සනාථ කරමි. මා රජයේ හෝමියෝපති රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමෙන් පසු මෙහි ඇතුළත් යම් විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව පත්වීම් බලධාරියාට අනාවරණය වුවහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද කිසිදු වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් ඉවත් කිරීමට ද යටත් වන බව මම දනිමි.

................................................. ...................................................,

දිනය අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ....................................................................(සම්පූර්ණ නම ) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් ..................................................... දින ඔහුගේ/ ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

................................................. ..................................................,

දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත් ඔහු /ඇයගේ වැඩ සහ හැසිරීම ...................................... බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු / ඇය මුදාහැරිය හැකිය / නොහැකිය.

................................................. ................................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

01 - 337

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ යටතේ පවතින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩුව (01) සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **බඳවා ගැනීමේ ක්‍රමය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත, මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවාගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පරිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. **අවශ්‍ය සුදුසුකම් :**

i. අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්:

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

ii. පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයකු වශයෙන් වසර තුනකට (03) නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.(සක්‍රිය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, සහතික කරන්නාගේ නිලමුද්‍රාව හා සහතික කළ දිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.)

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක* වසර තුන(03) කට නොඅඩු පළපුරුද්ද ලබා තිබීම.
(ලේකම් / දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානි විසින් නිකුත් කළ ලිපියකින් සනාථ කර තිබිය යුතු ය )

***සටහන :*** මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. **සේවා කාලය ආරම්භවන හා අවසාන වන දිනය පැහැදිලිව සඳහන් සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය .**

* නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරු ය .

iii. කායික යෝග්‍යතාව :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

iv. වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය,
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය,
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

ii. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

iii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව , නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ / රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත්විය යුතු වේ.

v. අයදුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ , ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

04. **වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

05. **වැටුප් පරිමාණය :**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 82,150 - 10 x 2,400 - 8 x 2,940 - 17 x 3,900 - රු.195,970 (SL1 – 2025) වේ.

06. **යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

| *අනු අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :**<br>***සටහන :*** ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | 25 |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබා ගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | 20 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද, | | |
| | • පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | • පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | • සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | | | |
| | (ඇ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සමාර්ථය | 10<br>05 | |
| | (සටහන : නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ.) | | |
| 02 | අතිරේක පළපුරුද්ද :<br>නඩුවට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ<br>කරුණු දැක්වීම. | | 35 |

| | නඩු ගොනු කිරීම් (එක් නඩුවක් සඳහා) | අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා) |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 2 | 5 |
| අභියාචනාධිකරණය | 2 | 4 |
| මහාධිකරණය | 2 | 3 |
| දිස්ත්‍රික් උසාවි | 4 | 5 |
| විනිශ්චයාධිකාර | 2 | 3 |

*සටහන-*

ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කල යුතුය.

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 03 | **තොරතුරු තාක්ෂණය/ තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම**<br>*සටහන :* ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.<br>අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම. | 10 | 10 |
| | ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්. | 08 | |
| | ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්. | 05 | |

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබා ගත් සහතික පත්‍ර. (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.) | 04 | |
| 04 | **භාෂා හැකියාව**<br>**සටහන :** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂා ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය. | 15 | 15 |
| | (ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරගවල දී (Moot court competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව<br><br><u>තනි</u><br>ලකුණු<br>i. ප්‍රථම ස්ථානය/ හොඳම කුසලතාව - 12<br>ii. දෙවන ස්ථානය - 10<br>iii. තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 08<br><br><u>කණ්ඩායම්</u><br>i. ප්‍රථම ස්ථානය/ හොඳම කුසලතාව - 10<br>ii. දෙවන ස්ථානය - 08<br>iii. තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 06 | 12 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින්/ රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක්. | 10 | |
| | (ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී හෝ Edexcel හෝ Cambridge උසස්පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 02ක් ඇතුළත IELTS සමස්ත ලකුණු 6.5 (සෑම විෂයකටම අවම ලකුණු 06ක් සහිතව) හෝ ඊට ඉහළ TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ ලබා තිබීම . | 08 | |
| | (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක් | 05 | |

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව :<br>තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ :<br>○ ශක්තීන් (Strength questions) (ලකුණු 02),<br>○ අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (Situational questions) (ලකුණු 03) හා<br>○ දක්ෂතාව (Competency questions) ( ලකුණු 10)<br>ඇගයීමට ලක්කිරීම අරමුණු කරගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | | 15 |
| | එකතුව | | 100 |

07. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

i. අයදුම්පත් **2026.03.03** දිනට හෝ ඊට ප්‍රථම **"සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 "** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම් පත්‍රයේ ආදර්ශ අකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 04 දක්වාත් දෙවැනි පිටුව 05 සිට 08 දක්වාත් තෙවැනි පිටුව 09 සිට 11 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

iii. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ *ගැසට්*කල තනතුරක් දරන නිලධාරියෙකු හෝ රුපියල් 82,150/- කට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

vi. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය.

2026 ජනවාරි මස 24 දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

**විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීම - 2026**

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

( අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

සිංහල - 2 / දෙමළ - 3 / ඉංග්‍රීසි - 4 ☐

*සටහන* :- අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

1.0. 1.1. සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ......................................................................
(සිංහලෙන්/දෙමළෙන්) : …………………………………………...

1.2. සම්පූර්ණ නම : ......................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3. මුලකුරු සමඟ නම (මයා/මිය/මෙය) : ...........................................
(සිංහලෙන්/ දෙමළෙන්) උදා: එම්.ජී.බී.එස්.කේ. ගුණවර්ධන.

1.4. මුලකුරු සමඟ නම් : ..........................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.0. 2.1. ස්ථිර ලිපිනය : ...................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

2.2. ස්ථිර ලිපිනය : ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

3.0. 3.1. ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 ☐ (අංකය කොටුව තුළ ලියන්න)

3.2. විවාහක/අවිවාහක බව: විවාහක - 1
අවිවාහක - 2 ☐ (අංකය කොටුව තුළ ලියන්න)

3.3. උපන්දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4. 2026................දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.5. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0. 4.1. දුරකථන අංකය ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

5.0. අධ්‍යාපන සුදුසුකම් :

5.1.

| *උපාධිය* | *ආයතනය* | *දිනය* |
|---|---|---|
| ........................................ | ........................................... | ............................... |
| ........................................ | ........................................... | ............................... |

6.0. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය : ................................................

6.1. ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දීමෙන් පසු වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කරන ලද දිනය : ....................

6.2. රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කරන ලද දිනය : .....................
* මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික/ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතිකකර අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

7.0. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තරය:

7.1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් : ..................................................................................

7.2. අතිරේක වෘත්තිය පළපුරුද්ද : ..................................................................................

7.3. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම: ..........................................................................

7.4. භාෂා හැකියාව : ....................................................................................................

* අතිරේක සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන අයදුම්පත හා එවිය යුතු නොවන අතර, එම ලේඛන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීමට සූදානම් කර තබා ගැනීම අයදුම්කරුගේ වගකීමකි.

8.0. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(ඔව් නම් විස්තර කරන්න)
.......................................................................................................................................

9.0. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණකර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත්වන බවත් ප්‍රකාශ කරමි.

......................................................, ..........................................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

*සටහන* - රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිව්රුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රුපියල් 82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

10.0. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...........................................................මයා/මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ ඇය මා ඉදිරිපිට දී ................................. දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

..........................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :
තනතුර :
දිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11.0. දෙපාර්තුමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් සඳහා පමණි)

ඉහත විස්තර සඳහන් .................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

...............................................,
දෙපාර්තුමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න)

01 - 452

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනයකර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 මාර්තු මස 02 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 දෙසැම්බර් මස 30 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කැකිරාව | කැකිරාව | කලාගම් කෝරළේ දකුණු කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ කළාගම් පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය |

01 - 375

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**පුත්තලම දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර්ධූරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැළකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි

සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 මාර්තු මස 02 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 දෙසැම්බර් මස 30 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | නාත්තන්ඩිය | නාත්තන්ඩිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා දකුණු පිටිගල් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

01 - 376

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටුකිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි ඉටු කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.
මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 මාර්තු මස 02 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 දෙසැම්බර් මස 31 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුර | තලාව | නුවරගම් පළාත කොට්ඨාසයේ කටියාව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර |
| අනුරාධපුර | හොරොව්පතාන | හුරුළු පළාත කොට්ඨාසයේ කපුගොල්ලෑව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර |
| අනුරාධපුර | මිහින්තලේ | නුවරගම් පළාත කොට්ඨාසයේ කයිපිටියාව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර |
| අනුරාධපුර | රඹෑව | නුවරගම් පළාත කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර |
| අනුරාධපුර | කහටගස්දිගිලිය | හුරුළු පළාත කොට්ඨාසයේ නෙළුගොල්ලාකඩ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු

**බදුල්ල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 මාර්තු මස 03 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජනවාරි මස 08 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | ඌව පරණගම | මැද පළාත කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා උඩුකිඳ කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

01 - 378

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මොණරාගල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටුකිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.
රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි.මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 මාර්තු මස 03 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජනවාරි මස 28 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මොණරාගල | මැදගම | බකිණිගහවෙල කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මැදගම කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල |
| මොණරාගල | බිබිල | බිබිල කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා බිබිල කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල |

01 - 379

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

**බදුල්ල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.
රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධූරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි.මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 මාර්තු මස 03 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජනවාරි මස 08 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | වැලිමඩ | ගුරුතලාව කොට්ඨාසයේ උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |
| බදුල්ල | වැලිමඩ | සිල්මියාපුර කොට්ඨාසයේ උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |
| බදුල්ල | බණ්ඩාරවෙල | බණ්ඩාරවෙල නගර කොට්ඨාසයේ උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |

01 - 380

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු

**බදුල්ල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 මාර්තු මස 03 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,<br>
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජනවාරි මස 16 දින,<br>
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | මීගහකිවුල | මීගහකිවුල කොට්ඨාසයේ, උප්පැන්න හා මරණ, මීගහකිවුල කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

01 - 381

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට නිලධාරින් සීමිත පදනම මත බඳවා ගැනීම - 2026 (2024 (II))

දිවයින පුරා පිහිටි රාජ්‍ය ආයතනවල ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ සිවිල්, යාන්ත්‍රික, විදුලි ඉංජිනේරු කාණ්ඩවලට අයත් තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා සීමිත පදනම යටතේ සුදුස්සන් තෝරා ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් ඉංජිනේරු සහකාරවරයකු හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක් දරන නිලධාරියකු හෝ අනෙකුත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් පත්වීම් බලධාරියා විසින් අනුමත කරනු ලැබූ සුදුසුකම්ලත් කාර්මික නිලධාරින්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ආයතන ප්‍රධානීන් මගින්, ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

කවරයේ වම්පස උඩ කෙළවරේ “ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම (සීමිත) – 2026 (2024 (II))” යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.03.03** දින වේ. (කෙසේ වුවද ආයතනික කටයුතු හෝ තැපැල් ප්‍රමාද හේතුවෙන් **2026.03.17** දින දක්වා රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය වෙත ලැබෙන අයදුම්පත් භාර ගනු ලැබේ. නමුත් එදිනට පසුව ලැබෙන අයදුම්පත් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

(ආ) අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සහ කොන්දේසි සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ඇ) **ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳ සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය. එමෙන්ම සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.**

සීමිත පදනම මත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට නිලධාරින් බඳවා ගැනීම මගින් සම්පූර්ණ කළ යුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු ගණන 36 ක්වන අතර එය පහත දක්වා ඇති කාණ්ඩ යටතේ බෙදී යනු ඇත.

| *කාණ්ඩය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| සිවිල් 01 කාණ්ඩය | 06 |
| සිවිල් 03 (වාරිමාර්ග) කාණ්ඩය | 10 |
| සිවිල් 04 කාණ්ඩය | 01 |
| සිවිල් 05 කාණ්ඩය | 01 |
| සිවිල් 06 කාණ්ඩය | 04 |
| සිවිල් 07 කාණ්ඩය | 07 |
| යාන්ත්‍රික 01 කාණ්ඩය | 02 |
| යාන්ත්‍රික 02 කාණ්ඩය | 02 |
| යාන්ත්‍රික 03 කාණ්ඩය | 01 |
| විදුලි 01 කාණ්ඩය | 02 |
| **එකතුව** | 36 |

**1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

1.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ජ්‍යෙෂ්ඨතාවයට හා කුසලතාවයට ලබා දෙනු ලබන ලකුණු පිළිවෙල පදනම් කරගෙන තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

1.2. නිලධාරියා අයදුම්පත යොමු කරන අවස්ථාවේ සේවය කරන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව /පළාත් පාලන ආයතනය අයත් වන බාණ්ඩය ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට බඳවා ගැනීමේ දී අදාළ කරගනු ලබන බාණ්ඩය ලෙස සලකනු ලබයි.

1.3. සීමිත බඳවා ගැනීම් යටතේ පත්වීමේ ලිපියක් මගින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට නිලධාරින් බඳවා ගනු ලබන අවස්ථාවේ දී ඔවුන්ගේ සේවා බාණ්ඩයන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1836/6 හා 2013.11.11 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ උපලේඛන I හි දැක්වෙන පරිදි තීරණය කරනු ලැබේ.

1.4. පත්වීම ක්‍රියාත්මකවන දිනය හා පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

2.1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1836/6 හා 2013.11.11 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදු කර ඇත්තා වූද මින් මතු සිදු කරනු ලැබිය හැකි වූද සංශෝධනවලට ද රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2. මෙම තනතුර ස්ථිරය. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු වේ.

2.3. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් වසර එකක (01) වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

2.4. එහෙත් වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

2.5. මෙම පත්වීම භාරගත් දින සිට වර්ෂ තුනක් (03) ඉකුත් වීමට පෙර, රජයේ ප්‍රතිපත්තිවලට අනුරූපව රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත් බව ඔබ විසින් සනාථ කළ යුතු වේ. ඔබ මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූයේ සිංහල භාෂාවෙන් නම් ඔබගේ අනෙක් රාජ්‍ය භාෂාව වනුයේ දෙමළ භාෂාව වේ. එසේම ඔබ මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූයේ දෙමළ භාෂාවෙන් නම් ඔබගේ අනෙක් රාජ්‍ය භාෂාව වනුයේ සිංහල භාෂාව වේ. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට ආනුශංගිකවන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාළ වේ.

2.6. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

2.7. පත්වීම්ලාභීන්, දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා වාර්තා කළ යුතු ය.

2.8. පත්වීම්ලාභීන් රාජ්‍ය සේවයේ මෙන්ම පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් වේ.

**3. වැටුප් පරිමාණය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2025 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට

රු.82,150 - 10x2,400 - 8x2,940 -17x3,900 - රු. 195,970/= ක මාසික වැටුප් පරිමාණය හිමි වේ.

**4. සුදුසුකම් :**

සුදුසුකම් සපුරා තිබිය යුතු බවට *ගැසට්* නිවේදනයේ සඳහන් දිනට, අයදුම් කරන ලද බාණ්ඩය අනුව පහත සඳහන් මූලික සුදුසුකම්වලින් එකක් සපුරා තිබිය යුතුවන අතර මෙහි 4.2 වගන්තිය යටතේ සඳහන් කර ඇති කොන්දේසි හා නියමයන් ද සපුරා තිබිය යුතු ය.

**4.1. මූලික සුදුසුකම්**

පහත (I), (II), (III), (IV) හා (V) වගන්ති යටතේ සඳහන් සුදුසුකම්වලින් එකක් සමඟ 2017 අංක 04 දරන පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ

සංස්ථාගත හෝ ආශ්‍රිත ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම.

I. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු ලෙස වසර 15 කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලැබ සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සම්පූර්ණයෙන් සමත් වීම.

II. දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු, එම දෙපාර්තමේන්තුවේ වසර 15 කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලැබ සේවය කර තිබීම.

III. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු ලෙස වසර 15 කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලැබ සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන රජයේ කාර්මික නිලධාරීන් සඳහා වන තුන්වන විභාගය (1979 ව්‍යවස්ථාව) සම්පූර්ණයෙන් සමත් වීම.

IV. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු ලෙස වසර 21 කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිතව එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර තිබීම.

V. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු ලෙස වසර 15 කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

*සහ*

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක, එම කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති බඳවා ගනු ලබන විෂය ධාරාව යටතේ වසර 04 ක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර උපාධිය ලබා තිබීම;

*හෝ*

(ආ) V (අ) හි දැක්වෙන උපාධි පාඨමාලාවට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ, අධ්‍යාපන හා අනෙකුත් සියලු අවශ්‍යතා බඳවාගනු ලබන විෂය ධාරාව යටතේ සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතිකයක් ලබා තිබීම.

**4.2. කොන්දේසි හා නියමයන් :**

4.2.1. තම අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ දී නිලධාරියා රාජ්‍ය සේවය / පළාත් රාජ්‍ය සේවය තුළ සේවයේ නිරත වී සිටිය යුතු යි.

4.2.2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පත්වීම ක්‍රියාත්මක කිරීමට නියමිත දිනය වනවිට කිසියම් පත්වීම්ලාභියෙකු රාජ්‍ය සේවයෙන් / පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වීමට කටයුතු කර නොතිබිය යුතු ය.

4.2.3. වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ පුරප්පාඩු වන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම් කිරීමේ දී එම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර නිලධාරියෙකු ලෙස අඛණ්ඩව සේවයේ යෙදී සිටීම අනිවාර්ය වේ.

4.2.4. දුම්රිය දෙපාර්තමේන්තුව තුළ පුරප්පාඩු වන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම්කිරීමේ දී එම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක් දරන නිලධාරියෙකු ලෙස අඛණ්ඩව සේවයේ යෙදී සිටීම අනිවාර්ය වේ.

4.2.5. අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල වියයුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කළ යුතු ය. අයදුම්පත අංක 1 සිට 09 දක්වා පළමු වන පිටුවටද, අංක 10 සිට 20 දක්වා දෙවන පිටුවටද, අංක 21 සිට 25 දක්වා තුන්වන පිටුවටද, අංක 26 සිට 26 හි iv දක්වා හතරවන පිටුවටද, අංක 26 හි v සිට 28 දක්වා පස්වන පිටුවටද, අයදුම්කරුගේ ප්‍රකාශයේ සිට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය දක්වා හයවන පිටුවට ද වනසේ අයදුම්පත සකස් කළ යුතු ය. අදාළවන එක් එක් ආකෘති පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක එක් පිටුවක් පමණක් භාවිතා කරමින් සකස් කළ යුතු ය. සම්පූර්ණ අයදුම්පත අයදුම්කරුගේ

අත් අකුරින් සකස් කර හෝ මුද්‍රිත හිස් අයදුම්පතක ඉල්ලා ඇති තොරතුරු අයදුම්කරුගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

4.2.6 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.

4.2.7 ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

**5. කායික සුදුසුකම්**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

**6. වෙනත් සුදුසුකම්**

6.1. අයදුම්පත් කැඳවන අවසන් දින වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන් හා ඊට සිදු කරනු ලැබූ සංශෝධනයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

6.2. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් හා කොන්දේසි සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**7. ලකුණු ලබා දීමේ පටිපාටිය (සම්මුඛ පරීක්ෂණයේ දී ලබා දෙන මුළු ලකුණු සංඛ්‍යාව 100 වේ)**

| *අනු අංකය* | *විෂයය* |
|---|---|
| **01** | **සේවා පළපුරුද්ද (උපරිම ලකුණු 60)**<br><br>සුදුසුකම්ලත්, බර තබන ලද සේවා පළපුරුද්ද වැඩිම අයදුම්කරුට ලකුණු 60 ක් ලබා දී සෙසු අයදුම්කරුවන්ට ඔවුන්ගේ බර තබන ලද සේවා පළපුරුද්දට සමානුපාතිකව අඩු වන සේ ලකුණු ලබා දෙනු ලැබේ.<br>සේවා පළපුරුද්ද සඳහා ලකුණු ලබා දීමේ දී සේවා පළපුරුද්දට අදාළ මූලික සුදුසුකම් (අනිවාර්ය සේවා කාලය) සම්පූර්ණ කළ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය දක්වා සේවා කාලය පදනම් කරගනු ලැබේ.<br>[බර තැබූ සේවා පළපුරුද්ද = I පන්තියේ සක්‍රීය සේවා කාලය + (විශේෂ පන්තියේ සක්‍රීය සේවා කාලය x 1.25)] |
| **02** | **කාර්මික දැනුම (උපරිම ලකුණු 20)**<br><br>සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පත් කර ඇති සිවිල්, යාන්ත්‍රික හා විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි විශේෂ දැනුමින් යුත් නිලධාරීන් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයක් මගින්, අදාළ ක්ෂේත්‍රයන්හි අයදුම්කරුවන්ගේ ඇති, ප්‍රායෝගික දැනුම හා මූලධර්ම පිළිබඳ ඇති දැනුම පරීක්ෂා කරනු ලබන අතර ප්‍රායෝගික දැනුම සඳහා ලකුණු 10 ක්ද මූලධර්ම පිළිබඳ ඇති දැනුම සඳහා ලකුණු 10 ක්ද බැගින් උපරිම ලකුණු 20ක් ලබා දෙනු ලැබේ. |
| **03** | **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (උපරිම ලකුණු 10)**<br><br><u>පරිගණක දැනුම (උපරිම ලකුණු 05)</u><br><br>මාස 06කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර ඇත්නම් උපරිම ලකුණු 05 ක් ලබා දෙනු ලැබේ.<br>මාස 03කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර ඇත්නම් ලකුණු 03 ක් ලබා දෙනු ලැබේ.<br>(උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. එක් නිලධාරියෙකු සහතික පත්‍ර 02 ක් හෝ වැඩි ගණනක් ඉදිරිපත් කර ඇත්නම් ඉහළම සුදුසුකම සහිත එක් සහතික පත්‍රයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) |

| අනු අංකය | විෂයය |
|---|---|
| 03 | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය (උපරිම ලකුණු 05)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර ඇත්නම් උපරිම ලකුණු 05 ක් ලබා දෙනු ලැබේ.<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කර ඇත්නම් ලකුණු 03 ක් ලබා දෙනු ලැබේ.<br>(උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. එක් නිලධාරියෙකු සහතික පත්‍ර 02 ක් හෝ වැඩි ගණනක් ඉදිරිපත් කර ඇත්නම් ඉහළම සුදුසුකම සහිත එක් සහතික පත්‍රයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) |
| 04 | **සේවා වාර්තා (උපරිම ලකුණු 05)**<br><br>a) කාර්යසාධනය (උපරිම ලකුණු 03)<br><br>පූර්වාසන්න වර්ෂ 03ක කාර්ය සාධනය සඳහා ලකුණු ලබා දේ.<br>“ඉතා හොඳයි” ලෙස සටහන් කර ඇත්නම් එක් වර්ෂයකට - ලකුණු 01 බැගින්<br>“හොඳයි” ලෙස සටහන් කර ඇත්නම් එක් වර්ෂයකට - ලකුණු 0.5 බැගින්<br><br>b) ප්‍රශංසා (උපරිම ලකුණු 02)<br><br>අයදුම්කරු ලබා ඇති ප්‍රශංසා සඳහා එක් ප්‍රශංසාවකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 02 දක්වා ලබා දෙනු ලැබේ. (පොදු 230 ආකෘති පත්‍ර මගින් සනාථ කළ යුතු ය. සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනට පෙර ලබා ඇති ප්‍රශංසා සඳහා පමණක් ලකුණු ලබා දේ.) |
| 05 | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය (උපරිම ලකුණු 05)** |

**සැළකිය යුතුයි.**

- අපේක්ෂකයෙකු විසින් සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී අදාළ සහතික හා ලේඛන ඉදිරිපත් කළ යුතු අතර එම සියලු ලේඛන / සහතික සෑම අතින්ම වලංගු ඒවා විය යුතු ය. නිසි බලධාරියාගේ ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක් / සහතිකයක් වලංගු නොවේ.

- අපේක්ෂකයන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා ඇත්නම් එවැනි අවස්ථාවල සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

- සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගීවීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**8.** අනන්‍යතාවය

අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු රියදුරු බලපත්‍රය

**9.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කළට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

**10.** මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

**11.** මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්.ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2026 ජනවාරි මස 27 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

*ආදර්ශ අයදුම්පත්‍රය*

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සීමිත - 2026 (2024 (II))**

**Limited Recruitment of Engineers to the Grade III of the Sri Lanka Engineering Service – 2026 (2024 (II))**

(1) අයදුම් කරන කාණ්ඩය : ..........................................................................................................................................
(එක් නිලධාරියෙකුට එක් කාණ්ඩයකට පමණක් ඉල්ලුම් කළ හැක)

(2) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
..........................................................................................................................
..........................................................................................................................

(3) අගට යෙදෙන නම මුලින්ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(උදා: GUNAWARDHANA, H.M.S.K.)
…………………………………………………………………………………………..

(4) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :
…………………………………………………………………………………………..
..........................................................................................................................

(5) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
…………………………………………………………………………………………..........................................
.........................................................................................

(6) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :
…………………………………………………………………………………………..........................................
.........................................................................................

(7) දුරකථන අංකය ස්ථාවර :.......................................... ජංගම :..........................................

(8) WhatsApp : ……………………………………………………………………………..

(9) විද්‍යුත් තැපැල : ....................................................................................................................

(10) ස්ත්‍රී / පුරුෂ බව ………………………………………………………………………..

(11) ජාතික හැඳුනුම්පත් අංකය : ………………………………………………………...

(12) විවාහක / අවිවාහක බව : ………………………………………………………...

(13) උපන් දිනය : වර්ෂය ………………මාසය ........................... දිනය ...........................

(14) අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට ( 2026.03.03 දිනට ) වයස :

අවුරුදු ............. මාස ............. දින ............

(15) ඉංජිනේරු ක්ෂේත්‍රය {සිවිල්/ යාන්ත්‍රික/ විදුලි } : ............................................

(16) දැනට සේවය කරන ස්ථානය (අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව/ පළාත් පාලන ආයතනය) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..........................................................................................................................................................
.............................................................................................................

(17) කාර්යාලීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ........................................................................................................
...................................................................................................................................

(18) කාර්යාලීය දුරකතන අංකය : ……………………… ෆැක්ස් :…………………….........
විද්‍යුත් තැපැල : ....................................................................................................................

(19) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරියකු ලෙස හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු (කලින් මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවය) ලෙස හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු වශයෙන් එම දෙපාර්තමේන්තුව වෙත හෝ සේවයට බැඳුණු දිනය :............................................

(20) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරියකු ලෙස හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු (කලින් මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවය) ලෙස හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු එම දෙපාර්තමේන්තුවේ හෝ පත්වීම ස්ථිර කරනු ලැබූ දිනය :.
............................................

(21) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු (කලින් මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවය) ලෙස රාජ්‍ය සේවයට බැඳුණු ආයතනය (අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව/ පළාත් පාලන ආයතනය) : .......................................
..................................

(22) දැනට සිටින සේවය : .........................................................................................................

(23) දැනට සිටින පන්තිය/ ශ්‍රේණිය : ...........................................................................................

(24) එක් එක් පන්තියට/ ශ්‍රේණියට පත්වීම් ලද/ උසස්වීම් ලද/ අන්තර්ග්‍රහණය කරන ලද දින සහිතව සේවය කරන ලද කාලසීමාවන් අනුපිළිවෙලින් (වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් එය ද ඇතුළත් කළ යුතු ය) :

| සේවයේ නම | පන්තිය/ ශ්‍රේණිය | කාල පරාසය | * සේවා කාලය | වැටුප් රහිත නිවාඩු | වැටුප් රහිත නිවාඩු අඩු කළ විට සේවා කාලය |
|---|---|---|---|---|---|
| | | ...... දින සිට ...... දින දක්වා | අවු ...... මාස ...... දින ...... | ...... දින සිට ...... දින දක්වා | අවු ...... මාස ...... දින ...... |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

*** අයදුම්පත් කැඳවනු ලබන අවසාන දින දක්වා**
**( අදාළ ලිපිලේඛන සත්‍ය පිටපතක් බවට සහතික කර අමුණා එවිය යුතු ය)**

(25) i. අයදුම්පත් කැඳවන අවසාන දිනට 2017 අංක 04 දරන පනත මඟින් ස්ථාපිත ඉංජිනේරුවරුන්ගේ සභාවේ සංස්ථාගත / ආශ්‍රිත ඉංජිනේරුවරයෙකු ලෙස වලංගු ලියාපදිංචිය ලබා ඇද්ද? ..........................................**(ලියාපදිංචිය අනිවාර්ය අවශ්‍යතාවයකි.)**

ii. ලබා ඇත්නම් සාමාජික අංකය: ...............................................

(26) අංක 1836/6 හා 2013.11.11 දිනැති අතිවිශේෂ *ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව හා එහි සංශෝධනයන් හි 7.3.1.2 වගන්තියට අනුව අවම සුදුසුකම් සපුරාලනුයේ **(සුදුසුකමට අදාළව ඉදිරියෙන් ඇති කොටුවෙහි x සලකුණ යොදන්න. අදාළ වැටුප් වර්ධක / කාර්යසාධන / ප්‍රතිඵල ලේඛන / උපාධි සහතික / සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛන සත්‍ය පිටපත් බවට සහතික කර අමුණා එවිය යුතුය)** :

i. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියකු ලෙස වසර 15 කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලැබ සේවය කර තිබීම හා විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සම්පූර්ණයෙන් සමත් වීම.

**ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සම්පූර්ණයෙන් සමත් වූ දිනය : .................................**
**ආකෘති පත්‍ර 01 සම්පූර්ණ කළ යුතුයි.** ☐

ii. දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියකු, එම දෙපාර්තමේන්තුවේ වසර 15 කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලැබ සේවය කර තිබීම. ☐

iii. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු ලෙස වසර 15 කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලැබ සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන රජයේ කාර්මික නිලධාරින් සඳහා වන තුන්වන විභාගය (1979 ව්‍යවස්ථාව) සම්පූර්ණයෙන් සමත් වීම. ☐

| විභාගය (1979 ව්‍යවස්ථාව) | ක්ෂේත්‍රය (සිවිල්/ යාන්ත්‍රික) | සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කරන ලද දිනය** |
|---|---|---|
| 1 විභාගය | | |
| 2 විභාගය | | |
| 3 විභාගය | | |

**** ආකෘති පත්‍ර 02,03,04 / ආකෘති පත්‍ර 05 සම්පූර්ණ කළ යුතු යි.**

(iv.) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු ලෙස වසර 21 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිතව එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර තිබීම. **(වසර 21 ක කාර්ය සාධන වල හා වැටුප් වර්ධක සහතික පත්වල සහතික කළ පිටපත් අමුණා එවිය යුතු යි.)** ☐

(v.) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු ලෙස වසර 15 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ **(වසර 15ක කාර්ය සාධනවල හා වැටුප් වර්ධක සහතික පත්වල සහතික කළ පිටපත් අමුණා එවිය යුතු යි.)**

*(අ)* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක, එම කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති බඳවා ගනු ලබන විෂය ධාරාව යටතේ වසර 04 ක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර උපාධිය ලබා තිබීම; ☐

*හෝ*

*(ආ)* (v) (අ) හි දැක්වෙන උපාධි පාඨමාලාවට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ, අධ්‍යාපන හා අනෙකුත් සියලු අවශ්‍යතා බඳවාගනු ලබන විෂය ධාරාව යටතේ සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතිකයක් ලබා තිබීම. ☐

(27) *අයදුම්කරුගේ සතුටුදායක සේවා කාලය:*

(i.) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා තිබේද යන්න : ..........................................................................................................

(ii.) ඉහත i හි පිළිතුර ඔව් නම් අදාළ ලේඛනයන්හි සහතික කරන ලද පිටපත් අමුණා එවන්න

(iii.) ඔබගේ සේවා කාලය තුළ දී විනයානුකූලව දඬුවමකට භාජනය වී ඇත්නම්, වරදේ ස්වභාවය, දී ඇති දඬුවම හා දඬුවම දුන් දිනය සඳහන් කරන්න (අදාළ ලේඛනයන්හි සහතික කරන ලද පිටපත් අමුණා එවන්න) : ....................................................................

.........................................................................................................................

.........................................................................................................................

**(28)**

(i.) පූර්වාසන්න පස් වසරක වැටුප් වර්ධක ලබා ඇත් ද යන වග : ...................................

(ii.) පූර්වාසන්න පස් වසරක කාර්යසාධනය සතුටුදායක හෝ ඊට ඉහළ මට්ටමක පවතී ද යන්න: ....................................... ..............................................................................................

**(ඉහත සඳහන් වැටුප් වර්ධක සහ කාර්යසාධනයන්හි සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතු ය)**

***අයදුම්කරුගේ ප්‍රකාශය:***

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හා වැරදි සහගත බව පත්වීම් ලබා දීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුරට නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව පත් කිරීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

දිනය : ..........................

.................................................,
අයදුම්කරුගේ අත්සන.

**ආසන්නතම අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය:**

අයදුම්පත විධිමත් පරිදි නිලධාරියා විසින් භාර දුන් දිනය : ......................................

................................................................................................................................................................................
................................................................................................................................................................................
................................................................................................................................................................................

දිනය : ..........................

...................................................................,
අත්සන හා නිල මුද්‍රාව.

**ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :**

දැනට මෙමෙ ............................................................................................... හි සේවයේ නියුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරි/ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ නිලධාරි/ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (කලින් මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවය) ................................................ ........................................................ මහතා / මහත්මිය/ මෙනවිය ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති / නැති අතර, එම නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද මෙම අයදුම්පත සුදුසු කටයුතු සඳහා ඉදිරිපත් කරමි. තවද, ඔහුට / ඇයට විරුද්ධව විනයානුකූල කටයුත්තක් අරඹා ඇති / නැති බවත්, ඉදිරියේ දී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට කරුණු ඉදිරිපත් වී ඇති/ නැති බවත් සහතික කරමි. (**අනවශ්‍ය වචන කපා හරින්න**).

දිනය : ..........................

...................................................................,
අත්සන හා නිල මුද්‍රාව
(ලේකම්/ ප්‍රධාන ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානී)

**ආකෘති පත්‍ර 01**

**ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

නම : ...........................................................................................................................

**ප්‍රායෝගික පරීක්ෂණය**

| *විෂයය* | | *ලකුණු* | | | |
|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| **I භාගය** | | | | | |
| I කාණ්ඩය | මට්ටම් ගැනීම (ප්‍රායෝගික පරීක්ෂණය) (>50%) | | | | |
| II කාණ්ඩය | මිනුම් (බිම් මැනුව) (ප්‍රායෝගික පරීක්ෂණය) (>50%) | | | | |

**ලිඛිත පරීක්ෂණය**

| *විෂයය* | | *ලකුණු* | | | |
|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ............ | *වර්ෂය* .......... | *වර්ෂය* .......... | *වර්ෂය* .......... |
| I භාගය | | | | | |
| III කාණ්ඩය | (අ) ව්‍යුහවාදය (ව්‍යුහ හා ද්‍රව්‍යවල ප්‍රභලතාවය පිළිබඳ සිද්ධාන්ත) | | | | |
| | (ආ) ද්‍රාව විද්‍යාව | | | | |
| II කාණ්ඩය | මිනුම් (බිම් මැනුව) (ප්‍රායෝගික පරීක්ෂණය) (>50%) | | | | |
| II භාගය | | | | | |
| I කාණ්ඩය | *(අ)* සැලසුම්, ඇඳීම හා සම්මත පිරිවිතර | | | | |
| | *(ආ)* වාරිමාර්ග | | | | |
| II කාණ්ඩය | *(අ)* ප්‍රමාණය (ප්‍රමාණ සමීක්ෂණය) | | | | |
| | *(ආ)* ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු විධිවිධාන | | | | |

**ලිඛිත පරීක්ෂණයේ අවම ලකුණු මට්ටම 40%**
**ලිඛිත පරීක්ෂණවල ලකුණු සාමාන්‍ය (>50%) : ...................................**

*සටහන* : I භාගයේ I කාණ්ඩයෙන් හා II කාණ්ඩයෙන් සමත්වීමට අපේක්ෂකයන් එම එක් එක් කාණ්ඩයෙන් 50% අවමයක් ලබා ගත යුතුය. අනෙක් ඕනෑම කාණ්ඩයකින් එක් එක් විෂයෙන් 40% අවමයක් ලබා ගැනීමෙන් එම විෂයෙන් සමත් විය හැකි වුව ද, විභාගයෙන් සමත් වීම පිණිස සියලු ලිඛිත පරීක්ෂණ පත් සඳහා 50%කට නොඅඩු සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

<u>04 කට නොවැඩි උත්සහ වාර ගණනක දී සියලුම කාණ්ඩ</u> ඉහත සඳහන් පරිදි සමත් වීමෙන් ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සමත් විය යුතු ය.

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

දිනය : ........................... ..................................................,
අයදුම්කරුගේ අත්සන.

**ආකෘති පත්‍ර 02**

**රාජ්‍ය සේවා කාර්මික නිලධාරීන් සඳහා පවත්වනු ලබන විභාග (සිවිල්/ යාන්ත්‍රික)**
**1979 ව්‍යවස්ථාව - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

නම : ..................................................................................................................................

**1 පරීක්ෂණය (සිවිල්)**

**අනිවාර්යය විෂයන් :**

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| ලිඛිත පරීක්ෂණය | | | | | | | |
| මිනුම් ප්‍රායෝගික | | | | | | | |
| මට්ටම් ගැනීම ප්‍රායෝගික | | | | | | | |
| මැනීම් හා මට්ටම් ගැනීම (පහළ පත්‍රය) | 03 | | | | | | |

විෂයය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු : ...............

(මිනුම් හා මට්ටම් ගැනීම විෂයේ සාමාර්ථයන් තීරණය කිරීමේ දී, ඉහත දක්වා ඇති කොටස් 03න් සෑම කොටසක් සඳහාම 35%ක අවම ලකුණු ප්‍රමාණයක් ලැබිය යුතු අතර සම්පූර්ණ විෂයෙන් සමත් වීම සඳහා කොටස් 03න්ම 40% සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ගත යුතු ය.)

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| ගණිතය (පහළ පත්‍රය) | 01 | | | | | | |
| ප්‍රමාණ ගැනීම (පහළ පත්‍රය) | 02 | | | | | | |
| සැලසුම් ඇඳීම හා පිටපත් කිරීම | 04 | | | | | | |

**වෛකල්පිත විෂයන් : පහත දැක්වෙන විෂයන්ගෙන් 02ක් සමත් විය යුතුයි.**

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| මූලික ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුව | 05 | | | | | | |
| ජල සම්පාදනය හා ජලාපවහනය | 06 | | | | | | |

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| වැඩ බිම් පාලනය | 07 | | | | | | |
| පාරවල් තැනීම හා නඩත්තුව | 08 | | | | | | |

විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු: ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියලු විෂයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතුය.)

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

දිනය : ..........................

...................................................,
අයදුම්කරුගේ අත්සන.

**ආකෘති පත්‍ර 03**

**2 වන පරීක්ෂණය (සිවිල්)**

**අනිවාර්යය විෂයන්**

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| ලිඛිත පරීක්ෂණය | | | | | | | |
| මිනුම් ප්‍රායෝගික | | | | | | | |
| මට්ටම් ගැනීම ප්‍රායෝගික | | | | | | | |
| මැනීම් හා මට්ටම් ගැනීම | 23 | | | | | | |

විෂයය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු : ...............

(මිනුම් හා මට්ටම් ගැනීම විෂයයේ සාමාර්ථයන් තීරණය කිරීමේ දී, ඉහත දක්වා ඇති කොටස් 03න් සෑම කොටසක් සඳහාම 35%ක අවම ලකුණු ප්‍රමාණයක් ලැබිය යුතු අතර සම්පූර්ණ විෂයයෙන් සමත් වීම සඳහා කොටස් 03න්ම 40% සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලද යුතු ය.)

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| ගණිතය (ඉහළ පත්‍රය) | 21 | | | | | | |
| ප්‍රමාණ ගැනීම (ඉහළ පත්‍රය) | 22 | | | | | | |
| ඇඳීම | 24 | | | | | | |

**වෛකල්පිත විෂයයන් : පහත දැක්වෙන විෂයයන්ගෙන් 03ක් සමත් විය යුතුයි.**

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| ගොඩනැගිලි ඉදිකිරීම (ඉහළ පත්‍රය) | 25 | | | | | | |
| ජල සම්පාදනය හා ජලාපවහනය | 26 | | | | | | |
| පාරවල් තැනීම හා නඩත්තුව | 27 | | | | | | |
| පාලම් හා විශාල ආකෘති තැනීම හා නඩත්තුව | 28 | | | | | | |
| වැඩ සංවිධාන | 29 | | | | | | |

විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු : ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියලු විෂයයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතුය.)

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

දිනය : ...........................

...................................................
අයදුම්කරුගේ අත්සන

**ආකෘති පත්‍ර 04**

**3 වන පරීක්ෂණය (සිවිල්)**

**අනිවාර්යය විෂයන්**

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| ලිඛිත පරීක්ෂණය | | | | | | | |
| මිනුම් ප්‍රායෝගික | | | | | | | |
| මට්ටම් ගැනීම ප්‍රායෝගික | | | | | | | |
| මැනීම් හා මට්ටම් ගැනීම | 48 | | | | | | |

විෂයය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු : ...............

(මිනුම් හා මට්ටම් ගැනීම විෂයයේ සාමාර්ථයන් තීරණය කිරීමේ දී, ඉහත දක්වා ඇති කොටස් 03න් සෑම කොටසක් සඳහාම 35%ක අවම ලකුණු ප්‍රමාණයක් ලැබිය යුතු අතර සම්පූර්ණ විෂයයෙන් සමත් වීම සඳහා කොටස් 03න්ම 40% සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලද යුතු ය.)

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව i | 41 | | | | | | |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව iii | 44 | | | | | | |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව iv | 45 | | | | | | |
| ගොඩනැගිලි ප්‍රමාණ ගැනීම හා ගොඩනැගිලි ඇස්තමේන්තු කිරීම | 46 | | | | | | |
| වාස්තු විද්‍යාත්මක ඇඳීම | 47 | | | | | | |

**වෛකල්පිත විෂයයන් : පහත දැක්වෙන විෂයයන්ගෙන් 01ක් සමත් විය යුතුයි.**

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව ii | 42 | | | | | | |
| පාරවල් තැනීම හා නඩත්තුව | 43 | | | | | | |

විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු : ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියලු විෂයයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතු ය.)

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

දිනය : ..........................

..................................................,
අයදුම්කරුගේ අත්සන.

**ආකෘති පත්‍ර 05**

**රාජ්‍ය සේවා කාර්මික නිලධාරීන් සඳහා පවත්වනු ලබන විභාග (සිවිල්/ යාන්ත්‍රික)**
**1979 ව්‍යවස්ථාව - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

නම : ...........................................................................................................................

**1 වන පරීක්ෂණය (යාන්ත්‍රික)**

**සියලුම විෂයයන් අනිවාර්ය වේ**

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| ගණිතය (පහළ පත්‍රය) | 01 | | | | | | |
| යාන්ත්‍රික ප්‍රමාණය | 09 | | | | | | |

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම | 10 | | | | | | |
| වැඩපළ පුහුණුව | 11 | | | | | | |
| ප්‍රායෝගික වැඩ (වැද්දුම් වඩුකම්හල්) ආදිය | 12 | | | | | | |
| මැනීම හා මට්ටම් ගැනීම (ප්‍රායෝගික) | 13 | | | | | | |

විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු : ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියලු විෂයයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතු ය.)

**2 වන පරීක්ෂණය (යාන්ත්‍රික)**

**සියලුම විෂයයන් අනිවාර්ය වේ**

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| ගණිතය (ඉහළ පත්‍රය) | 21 | | | | | | |
| යාන්ත්‍රික ප්‍රමාණ ගැනීම (උසස් පත්‍රය) | 30 | | | | | | |
| යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම (ඉහළ පත්‍රය) | 31 | | | | | | |
| කර්මාන්තශාලා පුහුණුව | 32 | | | | | | |

විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු : ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියලු විෂයයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතු ය.)

**3 වන පරීක්ෂණය (යාන්ත්‍රික)**

**සියලුම විෂයයන් අනිවාර්ය වේ.**

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ | වර්ෂය ............ |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව i | 49 | | | | | | |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව ii | 50 | | | | | | |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව iii | 51 | | | | | | |
| ඉංජිනේරු ආර්ථික විද්‍යාව | 52 | | | | | | |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව - ඇඳීම | 53 | | | | | | |

විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු : ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියලු විෂයයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතු ය.)

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

දිනය : ...........................

...................................................,
අයදුම්කරුගේ අත්සන.

01 - 454

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

### ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ අධිලේඛන සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය, ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය සහ චිත්‍රපට සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ අධිලේඛන සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය, ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය සහ චිත්‍රපට සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| පුරප්පාඩු සංඛ්‍යාව | - | අධිලේඛන සංරක්ෂක | 19 |
| | | ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක | 06 |
| | | චිත්‍රපට සංරක්ෂක | 04 |

මෙම පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% ක් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේය.

සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත 30%ක ප්‍රතිශතය සඳහා මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින් ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන් ම සම්පූර්ණ කරගනු ලැබේ.

01. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ අධිලේඛන සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය, ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය සහ චිත්‍රපට සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා වේ. අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.02.27** දින වේ. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වෙනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

02. තනතුරට පැවරෙන කාර්යන් :

| *තනතුරු අංකය* | *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|---|
| 01 | අධිලේඛන සංරක්ෂක | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති අධිලේඛන, සිතියම්, පින්තූර සංරක්ෂණය කිරීම හා ප්‍රතිසංස්කරණය කොට පවත්වාගෙන යාම, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලබාදෙන ඉලක්ක අනුව විද්‍යාත්මක උපදෙස් හා |

| තනතුරු අංකය | අනුමත තනතුරු නාමය | කාර්යයන් |
|---|---|---|
| 01 | අධිලේඛන සංරක්ෂක | ප්‍රමිතීන් අනුව කටයුතු කිරීම, පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු කිරීම් ඉටු කිරීම, අවශ්‍ය වූ තැන්හි රාජ්‍ය ආයතන/ පෞද්ගලික ආයතන හා පුද්ගලයන් සඳහා ලේඛන සංරක්ෂණ කටයුතුවලට සහභාගී වීම, රාජ්‍ය ලේඛන සංරක්ෂණයට අදාළ ප්‍රායෝගික පුහුණු කටයුතු ඉටු කිරීම, පූජ්‍ය ස්ථානවල ලේඛන සංරක්ෂණ කටයුතුවලට සහභාගී වීම, ආපදාවන්ට ලක්වූ ලේඛන ප්‍රතිසංස්කරණය පිළිබඳව ප්‍රායෝගික පුහුණුවීම් ඉටු කිරීම, අධිලේඛන සංරක්ෂණ අධීක්ෂණ නිලධාරී, ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන), ජාතික ලේඛනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ), ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (තාක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් ලේඛන) හා ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන තනතුරට අදාළ අනෙකුත් කාර්යයන් |
| 02 | ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන පවත්වාගෙන යාම හා සංරක්ෂණය සහ ඒවා පරිශීලනය කරන්නන්ට ශ්‍රවණය කිරීමට සැලසීම, එම ලේඛනවල පිටපත් පරිගණක හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් පරිශීලනය කරන්නන්ට ලබා දීම, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ පරිපාලනය, නඩත්තුව හා අලුත්වැඩියාව, ශ්‍රවණාගාරයේ පවත්වන උත්සව සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාවිතයට අවශ්‍ය තාක්ෂණික කටයුතු ඉටු කර දීම, ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය), ජාතික ලේඛනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය), ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (තාක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් ලේඛන) හා ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන තනතුරට අදාළ අනෙකුත් කාර්යයන් |
| 03 | චිත්‍රපට සංරක්ෂක | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් චිත්‍රපට පවත්වාගෙන යාම හා සංරක්ෂණය සහ ඒවා පරිශීලනය කරන්නන්ට දර්ශනය කිරීමට සැලසීම, එම චිත්‍රපටවල පිටපත් පරිශීලනය කරන්නන්ට ලබා දීම, චිත්‍රපට උපකරණ පරිපාලනය, නඩත්තුව හා අලුත්වැඩියාව, ශ්‍රවණාගාරයේ පවත්වන උත්සව සඳහා අවශ්‍ය චිත්‍රපට උපකරණ භාවිතයට අවශ්‍ය තාක්ෂණික කටයුතු ඉටු කර දීම, ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (චිත්‍රපට), ජාතික ලේඛනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය), ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (තාක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් ලේඛන) හා ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන තනතුරට අදාළ අනෙකුත් කාර්යයන් |

03. සේවා කොන්දේසි :

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද 2018.06.05 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවටද එම පරිපාටියට සහ සේවා ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු පුහුණු කාලසීමාව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් අනතුරුව අධිලේඛන සංරක්ෂක/ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක/ චිත්‍රපට සංරක්ෂක තනතුර සඳහා පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත බව දක්වා තිබුණ ද අනාගතයේ දී බඳවා ගනු ලබන නිලධාරීන් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ඇ) මෙම පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් වසර දෙකක පුහුණු කාලසීමාව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් අනතුරුව අදාළ ආයතන විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය

ඉදිරිපත් කිරීමෙන් පසු අධිලේඛන සංරක්ෂක III ශ්‍රේණියට/ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක III ශ්‍රේණියට/ චිත්‍රපට සංරක්ෂක III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ අධිලේඛන සංරක්ෂක III ශ්‍රේණියට/ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක III ශ්‍රේණියට/ චිත්‍රපට සංරක්ෂක III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අමතරව දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඈ) තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

04. මාසික වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 චක්‍රලේඛය (උපලේඛනය vi) අනුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ අධිලේඛන සංරක්ෂක (පුහුණු කිරීමේ ශ්‍රේණිය), ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක (පුහුණු කිරීමේ ශ්‍රේණිය) සහ චිත්‍රපට සංරක්ෂක (පුහුණු කිරීමේ ශ්‍රේණිය) ට අදාළ දීමනාව පහත පරිදි වේ.

පළමු වසර සඳහා මාසිකව : රු.43, 274/=
දෙවන වසර සඳහා මාසිකව : රු.45, 770/=

වසර දෙකක පුහුණු කාලසීමාව සතුටුදායක ලෙස අවසන් කිරීමෙන් අනතුරුව පවත්වනු ලබන විභාගයෙන් සමත් වන ආධුනිකයින් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ අධිලේඛන සංරක්ෂක III ශ්‍රේණියේ/ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක III ශ්‍රේණියේ / චිත්‍රපට සංරක්ෂක III ශ්‍රේණියේ තනතුරට පත්කරනු ලැබේ. පූර්වෝක්ත චක්‍රලේඛය අනුව ඊට අදාළ වැටුප් පරිමාණය (MN 3 - 2025) රු. 52 250/- - 10 x 800 -11x1190 -10 x 1320 – 10 x 1350 - රු.100 040/- (ආරම්භක වැටුප් පියවර - 52, 250/- ) ක් වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

05. බඳවා ගැනීමේ සුදුසුකම් :

| තනතුර | (අ) අධ්‍යාපන සුදුසුකම් | (ආ) වෘත්තීය සුදුසුකම් | (ඇ) පළපුරුද්ද |
|---|---|---|---|
| අධිලේඛන සංරක්ෂක (පුහුණු කිරීමේ ශ්‍රේණිය)<br>ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක (පුහුණු කිරීමේ ශ්‍රේණිය)<br>චිත්‍රපට සංරක්ෂක (පුහුණු කිරීමේ ශ්‍රේණිය) | අ.පො.ස. (සා.පෙළ) විභාගය<br>සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයන් හය (06) කින් එකවර සමත්ව තිබීම හා දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව සමත්ව තිබීම,<br>සහ<br>ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයන් අතුරින් විෂයන් දෙක (02) ක් සහිතව විෂයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) අ.පො.ස. උ.පෙළ විභාගය එකවර සමත් වීම. | අදාළ නොවේ | අදාළ නොවේ |

(ඈ) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

(ඉ) වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ඊ) වයස

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට අවුරුදු දහ අට (18)ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිහ (30)ට නොවැඩි විය යුතු ය.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අධිලේඛන සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය, ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය සහ චිත්‍රපට සංරක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව විවෘත බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. මෙම පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් වසර දෙකක පුහුණු කාලසීමාව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් අනතුරුව අදාළ ආයතන විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු අධිලේඛන සංරක්ෂක III ශ්‍රේණියට/ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂක III ශ්‍රේණියට/ චිත්‍රපට සංරක්ෂක III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයින්ගේ සේවය අවසන් කරනු ලැබේ.

(අ) ලිඛිත විභාගය :

විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් එක් එක් විෂයය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *විෂයයන්* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 02. තාක්ෂණය ( ඒ ඒ තනතුරට අදාළ විෂයානුබද්ධ පරීක්ෂණයකි.) | පැය 02 | 100 | 40 |

අපේක්ෂකයින් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු වන අතර සියලුම ප්‍රශ්න පත්‍රවලට එක් භාෂාවකින් පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

i. විභාග ප්‍රතිඵල - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තැපෑලෙන් හෝ www.slida.lk වෙබ් අඩවිය මගින් සිදු කෙරෙනු ඇත.

07. විභාගය සඳහා විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| 02. තාක්ෂණය - ඒ ඒ තනතුරට අදාළ තාක්ෂණික හා විෂයානුබද්ධ පරීක්ෂණයකි. | තනතුරුවලට අදාළ තාක්ෂණික දැනුම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |

08. විභාග ගාස්තු :

විභාග ගාස්තු රු.1200 කි. තවද එම විභාග ගාස්තුව **"ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්"** නමින් මහජන බැංකුව තිඹිරිගස්යාය ශාඛාවේ පවතින බැංකු ගිණුම් අංක 086-1001-3902-6218 යටතේ බැරකොට අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම් පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර

භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.

*09. අයදුම් කිරීමේ ක්‍රමය :*

(*අ*) අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදිය යුතු වේ. අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය 8 ½ " x 12" (ඒ4) කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. පරිගණකයෙන් සකස් කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. අයදුම්පත එක් භාෂාවකින් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමු පිටුවට ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතු ය.

(*ආ*) ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(*ඇ*) විභාගය සඳහාවන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2026.02.27** දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි "ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07." යන ලිපිනයට එවිය යුතු ය.

අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ..................................................... පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" යන්න පැහැදිලි ලෙස ලිවිය යුතු ය. **2026.02.27** දිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

(*ඈ*) අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(*ඉ*) අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරු විසින්ම විඳදරා ගත යුතු ය.

(*ඊ*) අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. (විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවියේ (www.slida.lk) පළ කරනු ඇත.) නිවේදනය පළවී දින 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග ශාඛාවේ දුරකතන අංක 011-5980264 හෝ 011-5980225 ඔස්සේ සතියේ වැඩ කරන දිනයන් හි පෙ.ව. 08.30 සිට ප.ව. 4.00 දක්වා විමසිය හැකිය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එසේ විමසීමේ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙ හි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එසේම විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ සියලුම විභාග අපේක්ෂකයන්ට ඒ බව දන්වා කෙටි පණිවිඩයක් (SMS) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් යොමු කරනු ඇත.

10. *විභාගයට ඇතුළත් වීම :*

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

***සටහන*** **-** අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

(ඇ) විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

12. *වෙනත් කරුණු :*

මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.

2026 ජනවාරි මස 30 දින,
අංක 07,
පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07,
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ දී ය.

ආදර්ශ අයදුම්පත

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ............................. .................... පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2026**

**Open Competitive Examination for Recruitment to the Post of Supervising Management Assistant Technical Services Category ................................................ Training Grade of the Department of National Archives - 2026**

විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ කොටුව තුළ ලියන්න.)

අයදුම් කරන තනතුර/ තනතුරු :

| *තේරීම* | *තනතුරු අංකය* |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

(*ගැසට්* නිවේදනයේ 02 ඡේදයට අනුව අංක යොදන්න.)

1. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................................
.....................................................................................................................................................
(උදා: HERATH MUDIYANSELAGE SAMAN RATHNAYAKA)

2. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................................
.....................................................................................................................................................
(උදා: H.M.S. RATHNAYAKA)

3. සම්පූර්ණ නම (සිංහලෙන්) : ..........................................................................................................

4. ස්ථිර ලිපිනය (සිංහලෙන්) : ..........................................................................................................
.....................................................................................................................................................

(අ) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (සිංහලෙන්) : ..........................................................................................................
.....................................................................................................................................................

(ආ) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................................
.....................................................................................................................................................

5. ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

6. ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(අ) දුරකථන අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ආ) විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය : ..........................................................................................................

8. උපන් දිනය :

(අ) වර්ෂය: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු: [ ][ ] මාස: [ ][ ] දින: [ ][ ]

9. අයදුම් කරනු ලබන පුහුණු ශ්‍රේණිය: ..................................................................

10. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගය : - පළමුවර

විභාග වර්ෂය : [ ]

විභාග අංකය : [ ]

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගය : - දෙවනවර

විභාග වර්ෂය : [ ]

විභාග අංකය : [ ]

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ඇ) අ.පො.ස. (උ/පෙළ) විභාගය :

විභාග වර්ෂය : [ ]

විභාග අංකය : [ ]

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |

11. *විභාග ගාස්තුව* : (ලදුපත අමුණා එවිය යුතු ය.)

(අ). ගෙවන ලද බැංකුව : ....................................................................

(ආ). ගෙවූ මුදල : ....................................................................

(ඇ). ගෙවූ දිනය : ....................................................................

(ඈ). ලදුපතේ අංකය : ....................................................................

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |

12. *අයදුම්කරුගේ ප්‍රකාශය/ සහතිකය* :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මා දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.................................................... .......................................... ,

දිනය අත්සන.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* : **(අදාළ නොවන වචන කපා හරින්න.)**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................ නමැති මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ................................ මස ....................වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන : ........................................................................................

සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ........................................................................................

තනතුර : ........................................................................................

ලිපිනය : ........................................................................................

(නිල මුද්‍රාව)

දිනය : ............................................................

***සටහන*** **:** අයදුම්පත සහතික කළයුත්තේ *ගැසට්* නිවේදනයේ 9 ඡේදයේ (ඈ) වගන්තියේ සඳහන් පරිදිය.

14. *ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................. නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයකු වන අතර, ඔහු/ ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය.

..................................................... නිල මුද්‍රාව :

ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය : .......................................

ආයතන ප්‍රධානියාගේ නම : ..........................................................................

තනතුර : ..........................................................................

සේවා ස්ථානයේ ලිපිනය : ..........................................................................



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.